**ආගරපතන ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආගරපතන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.2 ඡේදයේ (අ),(ආ),(ඇ), (ඉ), (එ) හා (ඔ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ කාර්යාල උපකරණ රු.299,700 ක් සහ ලී බඩු හා සවිකිරීම් රු.16,900 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය ඇතුළත් කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | පොදු තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂයන්වල දෝෂයක් නොතිබියදී ආරම්භක ශේෂ නිවැරදි කරන බව දක්වා ජර්නල් සටහන් 11 න් | එකතු කිරීමේදී ඇති වූ අතපසු වීමක් හේතුවෙන් වැඩියෙන් | - එම - |

| | | | |
|---|---|---|---|
| | රු.37,575ක් පොදු තැන්පත් ගිණුම හර කර සමුච්චිත අරමුදලට දෝෂ සහගතව බැර කර තිබුණි. | පෙන්වා තිබීම හේතුවෙන් එම ශේෂය නිවැරදි කරන බව | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම රු.1,006,675 ක් අඩුවෙන්ද තොග ශේෂය රු.29,750 ක් වැඩියෙන්ද දැක්විණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | මුඩුක්කු සංහාර නිවාස ඉදිකර තිබුණු ඉඩම් කොටස් පදිංචිකරුවන් වෙත සින්නක්කර ඔප්පු මඟින් පවරා දී තිබුණද, ඊට අදාළ රු.1,800,000 ක ඉඩම් කොටස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | නිවාස සම්බන්ධව අප සතුව කිසිදු ලියිවිල්ලක් නොමැති බැවින් අඩුපාඩුව සිදුවී ඇති බව පිළිගන්නා බව | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්, විෂයයන් 04 කට අදාළ ශේෂයන් ඊට අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.1,091,578 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

#### නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පනත් | | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ අනුමත නිවාඩු නිකේතනයකින් වාර්ෂික ආදායමින් සියයට 01ක් අය නොකර වෙළඳ බලපත්‍ර ගාස්තුවක් පමණක් අයකර තිබුණි . | මෙම වසරේ සිට අදාළ ආයතනයෙන් නිවැරදිව ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
----------------------

| | | | |
|---|---|---|---|
| මු.රෙ.571 (3) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කාලය ඉකුත් වූ වසර 3 සිට 5 දක්වා කාලයක් නිරවුල් නොකළ එකතුව රු.711,132 ක පොදු තැන්පත් ශේෂ 27 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් රැඳවුම් ලෙස පොදු තැන්පතු තුළ පවතින මුදල් පියවීම සඳහා අප ආයතනය සතුව ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ
--------------------

| | | | |
|---|---|---|---|
| 1988 මැයි 17 දිනැති අංක 22/1988 චක්‍රලේඛය | වරිපනම් බදු දේපලවල වසර 05 කට වරක් තක්සේරු නොකර 2008 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකරමින් පැවතුණි . | අදාළ තක්සේරු කිරීම් සඳහා කටයුතු සිදු කර නොමැති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,305,376 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,211,805 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
--------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,576,584 | 3,628,080 | 3,379,480 | 2,338,098 | 1,959,000 | 2,916,056 | 2,755,710 | 2,089,498 |
| (ii) | කඩ කුලී | 2,545,800 | 2,000,606 | 1,295,500 | 975,481 | 94,800 | 4,356 | | 24,125 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,830,000 | 1,694,500 | 1,694,500 | - | 2,610,000 | 1,447,000 | 1,447,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 64,739,712 | 4,135,820 | 2,897,847 | 2,328,221 | 56,170,050 | 2,373,333 | 3,552,433 | 1,090,248 |
| | | 71,692,096 | 11,459,006 | 9,267,327 | 5,641,800 | 60,833,850 | 6,740,745 | 7,755,143 | 3,203,871 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධන

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති වරිපනම් බදු හිඟයෙන් සියයට 62 ක් හා බිල්කිරීමෙන් සියයට 59 ක් අයකරගෙන තිබුණු අතර තවදුරටත් රු.522,462 ක් අයවිය යුතුව පැවතුණි .එසේම අක්කර බදු හා ඉඩම් බදු අය කිරීම සියයට 54ක් වැනි අඩු මට්ටමක පැවතුණි. වර්ෂය තුළ සමස්ථ බිල් කිරීම් වලින් අය කිරීම සියයට 55ක් පමණක් වුයෙන් ආදායම් අය කිරීමේ ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. | අදායම් අය කිරීම සිදු කරනු ලබන්නේ සෞඛ්‍ය කම්කරු සුපරීක්ෂක නිලධාරීයෙකු විසින් වන අතර ඔහු විසින් සියළුම නගර ආවරණය කරමින් ආදායම් අය කිරීම සිදු කළ යුතු වන අතර, ආදායම් අය කිරීම ඒ නිසා ප්‍රමාද වන බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | **වෙනත් ආදායම්** | | |
| | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 83 කින් රු.2,156,900 ක් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයකර ගෙන නොතිබුණි. | වෙළඳ ආයතනය වෙත කිහිප වතාවක් ලිපි යොමු කර ඇති නමුත් එම ආයතන විසින් අදාළ දැන්වීම් පුවරු සඳහා මුදල් ගෙවීම් සිදු නොකළ බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.2,328,221 ක් විය. | අදාළ ගාස්තු මේ වන තෙක් ආයතනය වෙත ලැබී නොමැති බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීමට කටයුතු කරන බව | වාර්ෂිකව කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 78 (1) අනුව කටයුතු නොකර සභාව සතුව ජල මූලාශ්‍ර 07 කින් පාරිභෝගිකයින් 474 කට භාවිතයට නුසුදුසු පානීය ජල බෙදාහැර තිබුණි. | ජලය නියමිත ප්‍රමිතියේ නොමැති බැවින් ජල පිරිපහදු ඒකක සඳහා ආධාර ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන බව. | පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 79,84,85,92,93 හා 95 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පොදු කානු, කසළ කානු, ජල මාර්ග, වැසිකිළි යනාදි කාර්යනට අදාළ ඉදිකිරීමේ නඩත්තු කටයුතු හා ඒවා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | පළාත් පාලන ප්‍රතිපාදන ඉල්ලුම් කරමින් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්ති වලට අනුව බල ප්‍රදේශයේ නිවාසවල මල ඉවත් කිරීම හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව දක්වා තිබුණද, මල ඉවත් කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් හා ඊට අදාළ ගලිරථ සේවාව පවත්වාගෙන ගොස් නොතිබුණි. | පළාත් පාලන ප්‍රතිපාදන ඉල්ලුම් කරමින් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ III කොටසේ විධිවිධාන ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ මංමාවත් තැනීම,වැඩිදියුණු කිරීම,වීදි මාවත් නම් කිරීම පෞද්ගලික දේපල හිමිකරුවන්ගේ යහපත සඳහා මාර්ග ඉදිකිරීම, සභාව සතු මාර්ග ගැසට් කිරීම හා යනාදි කිසිදු කාර්යක් සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් යොදවා ඉටුකර නොතිබුණි. | පළාත් පාලන ප්‍රතිපාදන ඉල්ලුම් කරමින් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 119 ප්‍රකාරව පදිංචිකරුවන්ගේ අවශ්‍යතාවය සඳහා පොදු වෙළඳපළවල් හෝ සති පොලවල් ආරම්භ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් පාලන ප්‍රතිපාදන ඉල්ලුම් කරමින් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, මන්රාසි නගරයේ මගී ආවරණයක් ඉදිකිරීම සඳහා රු.500,000 ක ඇස්තමේන්තුවක් මත කොන්ත්‍රාත්කාර ආයතනයකට ඉදිකිරීම පවරා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් අනුමත සභා සැලැස්මට පරිබාහිරව කටයුතු කරමින් අතුරු මාර්ගය හා නව පාලම ඉදිකිරීම | දැනට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | කර්මාන්ත ඉටු කිරීමේදී ඇස්තමේන්තු ප්‍රකාරව එය ඉටුකරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා යොදා තිබුණු තාවකාලික පාලමද අවහිර කරමින් මීටර් 6 x 10 ප්‍රමාණයේ දෙමහල් ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණද, සභාව මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | | |
| (ආ) | 2018 වර්ෂයේදී සභා අරමුදල් මගින් ඉටු කිරීමට ගිවිසුම් ගතවී තිබූ රු.2,689,941 ක කර්මාන්ත 08 ක් අදාළ වර්ෂය තුළ නිමවා තිබුණද, කර්මාන්ත සඳහා රු.1,021,461 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාත් ගෙවීම් කර නොතිබුණි. | අදාළ රඳවුම් මුදල් කොටස් වශයෙන් හෝ ගෙවීමට කටයුතු කරමින් පවතින බව | පරීක්ෂාකර බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අළුතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතනවල පහසුකම් සැලසීම සඳහා 2019 වර්ෂයේ ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් රු.1,902,345 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන අරමුණුගත කාර්යයට යොදවාගෙන නොතිබුණි. | ප්‍රමාණවත් ඉඩකඩක් සහිත කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකළ පසු කාර්යාල උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන බව | තැන්පත් මුදල් අරමුණ ගත කාර්යයට වැයකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලී බඩු හා සවි කිරීම් යටතේ දක්වා ඇති වත්කම් ඒකක 16 ක්, ඉඩම් හා ගොඩනැගිලි 05 ක්, පොදු වැසිකිළි 06 ක් හා අත්කරත්තයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නාගසේන හා මෙරායා මහජන පුස්තකාලවල පැවති එකතුව රු. 1,202,013 ක ලී බඩු උපකරණ හා විදුලි උපකරණ ඒකක 40 ක් භාවිතයට නොගෙන වසර 04 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | ආයතනය සතුව ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් අදාළ කාර්යාල උපකරණ නිෂ්කාර්යයව පවතින බව | උපකරණ ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් වාහනයක් 2020 සැප්තැම්බර් 05දින අනතුරට ලක් වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාත් අළුත්වැඩියා නොකර ඌන උපයෝජිතව පැවතුණි. | මුදල් රෙගුලාසි 104 (4) පරික්ෂණ වාර්තාව අදාළ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඔඩිල්ටන් ඉඩම් වෙන්දේසියේදී නුවරඑළිය ප්‍රාදේශීය සභාව වෙත පවරාදුන් රු.18,677,700 ක ඉඩම් කොටස් 02ක් ආගරපතන ප්‍රාදේශීය සභාවට පවරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත්, එහි අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාළ පාර්ශව සමඟ සාකච්ජා කර අප වෙත පවරා දී ඇති ඉඩම් නිසි උපයෝගීතාවයකින් යොදවා ගැනීමට කටයුතු කරන බව | ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව පරිභෝජනය කරන වාහන 04ක අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයිතිය පවරාගෙන නොතිබුණි. | සභාව සතු වාහන වල අයිතිය පවරා ගැනීම සඳහා MT-6 අයදුම්පත් සමඟ ලිපි අදාළ වාහන අප වෙත පවරා දුන් ආයතන වෙත යොමු කර ඇති බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3. 5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය සභාවෙන් ආගරපතන ප්‍රාදේශීය සභාව වෙත අනුයුක්ත කරන ලද ස්ථිර පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 11 දෙනෙකු වසර 06 සිට වසර 24 දක්වා කාලයක සිට සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සේවකයන්ගේ තනතුරු ස්ථිර කරගැනීමට ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව | අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අනුමත කාර්යය මණ්ඩලය 98කින් සමන්විත වුවද, තනතුරු 17ක පුරප්පාඩු 78 ක් පැවතිණි . | පලාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත 2024 අප්‍රේල් 29 දින ද නැවත ලිපියක් යොමු කරන බව | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |